# 16. විශේෂ යැදුම්

එදා සවස තාත්තා වැඩ ඇරිලා එනකම් කුමාර් බලා සිටියා. දුරදී ම තාත්තා එනවා දැක්කා. කුමාර් පාරට දුවලා ගිහිල්ලා ''තාත්තේ අද සමන්ගේ උපන් දිනය. එයාගේ ගෙදරට මාව එක්ක ගෙන යනවා ද?'' කියා ඇසුවා. තාත්තා සතුටින් කුමාර්ගේ ඉල්ලීම ඉටු කර දුන්නා.

කුමාර්ගේ ඉල්ලීම වගේම දිනක් ජේසුතුමාත් දෙවි පියාණන්ට කතා කරලා වැදගත් ඉල්ලීමක් කළා. මොකක් ද ඒ වැදගත් ඉල්ලීම? දේව පියාගේ වැඩ කරන්න ජේසුතුමාට උදවු වෙන්න පුළුවන් හොඳ මිතුරන් කීපදෙනෙක් තෝරා දෙන්න කියලා.

ඉතිං දේව පියා ජේසුතුමාගේ ඉල්ලීම ඉටු කළා. හොඳ මිතුරන් දොළොස් දෙනෙක් තෝරා ගැනීමට මග පෙන්වුවා.



සීමොන් පේදුරු, ජාකොබ්, ජොහාන් වැනි මිතුරන් ජේසුතුමාට එකතු වුණේ ඔන්න ඔහොමයි.

## පැවරුම්

1. මේ පාඩමේ සඳහන් පරිදි ජේසුතුමා දේව පියාගෙන් ඉල්ලූ වැදගත් ඉල්ලීම කුමක් ද?

2. ඔබ ජේසු තුමාගෙන් ඉල්ලන වැදගත් ඉල්ලීම් දෙකක් ලියන්න.